
# 10 ශ්‍රේණිය

# ඉතිහාසය



06 -

## ඓතිහාසික දැනුම සහ එහි ප්‍රායෝගික ආදේශනය

**නිපුණතාව -**

ශ්‍රී ලංකාවේ ඓතිහාසික ජන සමාජයේ උරුම වූ දර්ශනය සහ සාම්ප්‍රදාය අවබෝධ කර ගනිමින් ඒවා තම ජීවිතය හැඩ ගසා ගැනීමට උපයෝගී කර ගනියි.

**නිපුණතා මට්ටම -**

අපේ මුතුන් මිත්තන්ගේ උරුම වූ සමාජ දැක්ම සහ පොදු භාවිත පිළිවෙත් අර්ථවත් සමාජයක් ගොඩ නැගීමට යොදා ගත හැකි ආකාරය පෙන්වා දෙයි.

**ඉගෙනුම් ඵල -**

- ඓතිහාසික ජන සමාජයෙන් උරුම වූ සමාජ දැක්ම හා පොදු භාවිත පිළිවෙත් විස්තර කරයි.
- සමාජ දැක්ම හා පොදු භාවිත පිළිවෙත් ප්‍රායෝගිකව ආදේශ කළ ආකාරය විස්තර කරයි.
- ඓතිහාසික දැනුම වර්තමානයේ අර්ථවත් සමාජයක් ගොඩනැගීම සඳහා භාවිතා කළ හැකි ආකාරය පෙන්වා දෙයි.

# 06 පාඩම -

# ඓතිහාසික දැනුම සහ එහි ප්‍රායෝගික ආදේශනය

මානව පරිණාමය සිදු වීමේදී දැනුම ඉතා වැදගත් සාධකයක් විය. අතීත මිනිසා සතු වූ දැනුම වර්තමානය සඳහා ප්‍රායෝගිකව ආදේශනය කර ගත හැකි අවස්ථා එමටය. ඓතිහාසික දැනුම පිළිබඳ මාතෘකා කීපයක් යටතේ දැනුම මෙහිදී සාකච්ඡා කරනු ලැබේ. ඒ ඇසුරින් දෙන ලද ඇගයීම් 10 ශ්‍රේණියේ පෙළ පොත ඇසුරින් ඔබට නිම කර ගත හැක. අප පහත මාතෘකා පිළිබඳ තොරතුරු විමසා බලමු.

## 6.1 ඓතිහාසික යුගයේ සමාජ සංවිධානය -


- සමාජයක් තිරසර ලෙස පවත්වා ගෙන යාම සමාජ සංවිධානයයි.
- පුද්ගල සම්බන්ධතාවල අනුපිළිවෙල ධූරාවලිය නම් වේ. එය කොටස් 2කි.
    1. සිරස් ධූරාවලිය - ඉහළ සිට පහළට
    2. තිරස් ධූරාවලිය - බලය සමානව පැවතීම.

- රජු නරඉසෙර ලෙස දඹුළු විහාර සෙල්ලිපියේ සඳහන් ය.
- රාජකීය නිළධාරීන් රද්කොල් සම්දරු නම් විය.
- සමාජය කොටස් 2කි.
    1. ප්‍රභූන් - වෙළඳ ප්‍රධානීන්, වෛද්‍යවරු, ගුරුවරු..............................
    2. සාමාන්‍ය ජනතාව - ගොවීන්, වළං සාදන්නෝ, මැණික් කපන්නෝ................................
- සාමාන්‍ය ජනයා කුඩීන් ලෙස හැඳින්වේ.

- සමාජයේ පහළම මට්ටම දාසයන්ටය. වර්ග 2කි.

    1. අන්වයාතදාස - පාරම්පරික දාසයන්
    2. ධනක්කීතදාස - කුලියට ගත් දාසයන්

- සමාජය බිඳ වැටීමට නොදී ආරක්ෂා කර ගැනීම සමාජ ඒකාබද්ධතාවයයි.




*සටහන අංක 6.1 ඓතිහාසික යුගයේ දී ශ්‍රී ලංකාවේ පැවති සමාජ සංවිධානය පෙන්නුම් කරන සටහනක් (උපුටා ගැනීම් මහාචාර්ය සේනක බණ්ඩාරනායක 2013 වසරේදී පළ කළ රචනයකිනි).*

## <u>ඇගයීම -</u>

01) සමාජ සංවිධානයක් යනු කුමක්ද ?

02) ප්‍රධාන සමාජ ධූරාවලි දෙක නම් කරන්න.

03) කුඩීන් ලෙස හැඳින්වූයේ කවුද ?

04) දාසයන් වර්ග දෙක නම් කරන්න.

05) සමාජ ඒකාබද්ධතාව යනු කුමක්ද ?

## 6.2 නීතිය හා සම්ප්‍රදාය -

- සමාජයක් සම්මත කර ගන්නා පොදු පිළිගැනීම් නීතිය බවට පත්වේ.
- නීතිය හා සම්බන්ධ පැරණි ආයතන "වදාළ හා සභා" ලෙස දැක්වේ.
- ආරක්ෂක නිළධාරීන් "මේ කාප්පර්" ලෙස හැඳින්වේ.
- අය කළ ප්‍රධාන බදු වර්ග කීපයකි.

    1. දකපති - වැව් ජලය භාවිත කරන්නන්ගෙන්
    2. බොජකපති - රජුට අයත් ඉඩම් වගා කිරීම වෙනුවෙන්
    3. මතරමජිබක - ඇළ මාර්ග වල මත්ස්‍යයින් ඇල්ලීමට

- කෘෂි කටයුතු නිසි ලෙස කර ගෙන යාමට නීති පනවා ඇත. (කොණ්ඩවට්ටවාන්, වෙස්සගිරි ලිපි)
- වෙළඳපල පාලනයට නීති සොරබොර වැව හෙවත් බදුළු ටැම් ලිපියේ සඳහන්ය.
- සතුන් ආරක්ෂා කිරීමට රජවරු නීති හා දඬුවම් පනවා ඇත.

## ඇගයීම -

01) නීතිය සම්බන්ධ පැරණි ආයතන දෙක නම් කරන්න.

02) පළමු වන විජයබාහු රජුට ආරක්ෂාව සැපයූ දණ්ඩනායකයා කවුද ?

03) වෙළඳාම සම්බන්ධයෙන් බදුළු ටැම් ලිපියේ සඳහන් නීති තුනක් සඳහන් කරන්න.

## 6.3 මුදල් හා විනිමය -

- ආර්ථිකමය අරමුණකින් කරනු ලබන හුවමාරු ක්‍රියාවලියකි.
- මුල් කාලයේ පැවතියේ භාණ්ඩ හුවමාරුවයි.
- මෙරට කාසි භාවිතය ඇරඹෙන්නේ ක්‍රි.පූ. 250 දීය.
- පැරණිම කාසි "කහාපණ" ලෙස හැඳින්විය.
- කාසි අච්චු ගැසූ නිළධාරියා "රූප අධ්‍යක්ෂ" (රූපදක) නම් විය.
- රෝම, චීන, අරාබි, VOC (ලන්දේසි කාසි), බ්‍රිතාන්‍ය ආදී කාසි ලැබීම විදේශීය වෙළදාම පැවති බවට සාධකය



ඡායාරූපය අංක 6.2 ශ්‍රී ලංකාවේ භාවිත වූ පැරණිතම කාසියක්. මෙම කාසි වර්ගය හඳුන්වන්නේ තැලූ කාසි යනුවෙනි. ඒවා නිපදවන ලද්දේ ඉන්දියාවේ දීය. වෙළෙඳුන් විසින් එම කාසි මෙරටට ගෙන එන ලදී.

## ඇගයීම -

01) ලංකාවේ කාසි භාවිතය ආරම්භ වූයේ කිනම් සියවසේදී ද ?

02) මෙරට මුල්ම කාසි සෙල්ලිපිවල හැඳින් වූ නම කුමක්ද ?

03) කාසි අච්චු ගැසූ නිළධාරියා කවුද ?

04) "රන් දෙවිසි කළඳයි" ලියූ රන් ලෝහ කැබැල්ල සොයා ගත්තේ කොහෙන්ද ?

05) ලංකාවෙන් හමු වූ විදේශීය කාසි මොනවාද ?

## 6.4 කාන්තා නියෝජනය -

- පැරණි සමාජයේ කාන්තාවට උසස් තැනක් ලැබිණි.
- චූලසීවලීදේවී, ලීලාවතී, කල්‍යාණවතී මෙරට සිටි රැජිණියන් ය.
- ස්වාමියා එනතුරු වසර තුනක් හුදකලාව සිටි කාන්තාවක් ගැන රසවාහිනියේ සඳහන්ය.
- දෙමාපියන් තම දියණිය සූප ශාස්ත්‍රයේ නිපුණ කරවිය යුතු බව සහස්සවත්ථුප්පකරණයේ සඳහන්ය.
- "මධුපාචිකා" යනු සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන්ය.
- ප්‍රාදේශීය පාලනය සම්බන්ධ කාන්තාව"පරුමකලු" නම් විය. (පරුමකලු සමනා)
- පැරණි කාන්තාව  රූපලාවන්‍ය ගැන දැන සිටි බව උඩරංඩාමඩමින් ලද සාක්ෂි වලින් පෙනේ. (ලෝහ කූරක්, රතු, කහ ගුරුගල්, මැටි පිබළු)

## ඇගයීම -


01) පැරණි සමාජයේ කාන්තාව හිමිකර ගෙන සිටි ස්ථානය පිළිබඳ නිදසුන් තුනක් දෙමින් පැහැදිලි කරන්න.

## 6.5 දේශීය ආහාර -

- ඓතිහාසික යුගයේදී බහුලව ධාන්‍ය භාවිතා විය. (වී, කුරක්කන්, උඳු, මුං, තල, මෑ................)
- ප්‍රභූන්ගේ ආහාරය සුවඳ ගිතෙලින් පිසූ මොනර මස් හා ඇල්හාල් බත් බව සද්ධර්මරත්නාවලියේ සඳහන්ය.
- දුගී ආහාරය වූයේ පලා මාළුව, කාඩි ඇඹුල හා නිවුඩු හාලේ බත්ය.
- තිල සංගුලිකා හෙවත් තලගුලි ගැන දම්පියා අටුවා ගැට පදයේ සඳහන්ය.
- අලවර්ග හා එළවළු ආහාරයට ගැනිණි.
- එළවළු පිසීම ආකාර තුනකි.

  1. ආනම
  2. ඇඹුල
  3. නියඹලාව

- ආහාර රස ගැන්වීමට කුළු බඩු යොදා ගෙන ඇත.
- කිරි පරිභෝජනය ජනප්‍රිය විය.
- කැඳ වර්ග රැසක් ගැන සඳහන්ය.
- පැරණි ජනයා නීරෝගිභාවය ගැන සිතා පෝෂ්‍යදායී ආහාර ගෙන ඇත.



### ඇගයීම -

01) පැරණි සමාජයේ මිනිස්සු ගත් ආහාර ලැයිස්තුවක් සකසන්න.

1. ධාන්‍ය වර්ග
2. අල වර්ග
3. එළවළු වර්ග
4. කුළුබඩු වර්ග
5. තෙල් වර්ග
6. පාන වර්ග
7. සත්ත්ව වර්ග

ඡායාරූපය අංක 6.5 ප්‍රණීත ආහාර බුදින පිරිසක් දැක්වෙන ක්‍රිස්තු වර්ෂයෙන් දහනමවන සියවසේදී අඳින ලද චිත්‍රයක්. මෙය මුල්කිරිගල විහාරයේ දක්නට තිබෙන්නකි.

## 6.6. පරිසරය ආරක්ෂා කර ගැනීම -

- ස්වාභාවික පරිසරය ආරක්ෂා කර ගත යුතු බව දැන සිටීම.
- පරිසරය විනාශ කිරීම ගැටළු වලට හේතුවක් බව දැන සිටීම.
- පරිසරය ආරක්ෂා කර ගැනීමට රජවරු නීති පනවා තිබීම.



ඡායාරූපය අංක 6.6 පරිසරය පිළිබඳව අපේ මුතුන්මිත්තන් තුළ මහත් අවධානයක් තිබිණි. හැකි සෑම අවස්ථාවක ම පරිසරය සුරැක ගැනීමට ඔවුහු කටයුතු කළහ. පරිසරයේ තිබෙන ජීවමාන බව පෙන්වන මෙම චිත්‍රය දහනමවන සියවසේ දී කැලණි විහාරයේ අඳින ලද්දකි.

## ඇගයීම -

01) උස් ගොඩබිම් ඉඩම්වල කැළෑ නොකැපිය යුතු බවට නියෝග කළේ කවුද ?

02) "වල්වල දඬුපත් නොකපනු ඉසා" යනුවෙන් සඳහන් සෙල්ලිපිය කුමක්ද ? එය පිහිට වූ රජු කවුද ?

03)කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය පිහිට වූ රජු කවුද ?